



# මුල්ම රබර් පැළයට සෙවණ දුන් ගම්පහ මල්වත්ත

ගම්පහ මිනුවන්ගොඩ මාර්ගයේ ගමන් කරන්නකුට ගම්පහ සිට 1KM පමණ දුරින් පිහිටි මල්වත්ත හන්දියේ සිට 200m පමණ වම්පසට ගමන්ගත් විට හමුවන්නේ ඉතාමත් නිස්කලංක පරිසරයක් සහිත ඉතා සිත් ඇදගන්නා උද්‍යානයක් වන ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානය යි.

එක් පසකින් අත්තනගලු ඔයෙනුත්, තවත් පසෙකින් වැඩිල්ල ඇලෙනුත් මායිම් වී ඇති මෙහි භූමි ප්‍රමාණය අක්කර 36 ක් පමණ වන අතර, මෙහි නෙත් කලාපීය ශාක නියෝජනය කරමින් මීවන ශාකවල සිට ආවෘත බීජක විවෘත බීජක ශාක දක්වා විශාල වෘක්ෂයක් යම්කිසි කළමනාකරනයකට අනුව රෝපණය කර ඇති බව දැකගත හැකි ය.

මෙම අපූරු උද්‍යානය ගැන විස්තර දැන ගැනීම සඳහා "නවයුගය" චාරිකාවක යෙදින. එහිදී උද්‍යානයේ කෙළවරකට වන්නට පිහිටි උද්‍යාන කාර්යාලය වෙත ගිය අපට එහි භාරකාර පාලක වශයෙන් සේවය කරන **ඩී. එච්. පී. පෙරමුණගම** මහතා මුණ ගැසුණු අතර, 15 වසරක සිට එම උද්‍යානය පාලනය කරන ඒ මහතාගෙන් උද්‍යානයේ අතීතය හා වර්තමානය ගැන වැඩි-පුර බොහෝ දෑ දැන ගැනීමට අපට හැකි විය. පෙරමුණගම මහතා පළමුව මෙම උද්‍යානයේ අතීතය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරමින් මෙසේ ප්‍රකාශ කර සිටියේ ය.



මුල්ම රබර් වගාවේ සිහිවටන

මෙම උද්‍යානය ආරම්භය 1876 වැනි ඈත කාලයට දිව යනවා. අපේ රට යටත් විජිත-යක් ව පැවති සමයේ, ඉංග්‍රීසි ජාතික ස්වාභාවික විද්‍යාඥයන් විසින් සොයා ගන්නා ලද රබර් ශාකය රෝපණය කිරිම සඳහා සුදුසු ස්ථානයක් තෝරමින් සිටි කාලයේ දී ඔවුන් කොළඹ – නුවර දුම්රිය මාර්ගයෙන් ගමන් කරන විට ගම්-පහ ප්‍රදේශය පසුකර යැමේදී එම ප්‍රදේශයේ සුදුසු දේශගුණික හා භූ



ඩී. එච්. පී. පෙරමුණගම

ලක්ෂණ තත්ත්වයන් ඇති බව දැනගත්තා. පසුව ඔවුන් ඒ සඳහා ගම්-පහ සුදුසු භූමියක් තෝරා, තෝරා ගත් භූමිය සහිත ප්‍රදේ-ශය අද හෙනරත්-ගොඩ උද්භිද උද්‍යානය ලෙස පිහිටා ඇත.

ස්වාභාවික විද්‍යාඥ-යන් විසින් තෝරා ගන්නා ලද මෙම භූමි භාගය රබර් වර්ග කිපයක් වන 'පාරා රබර්', 'සියාරා රබර්', 'මැකොනික් රබර්' වර්ග මෙහි රෝපණය කළ ද මෙහි දේශගුණික තත්ත්වයන්ට ගැළපුණු රබර් ශාකය 'පාරා රබර්' ශාකය පමණි. මෙය විද්‍යාත්මක Hevea brasliensis ලෙස හඳුන්වයි. මෙම කාලය තුළ මෙහි සියලු කළමනාකරනය පේරාදෙණිය උද්භිද උද්‍යානයන් මඟින් සිදුකර ඇති අතර එය බලා ගැනීම සඳහා **ඒ. ඒ. මහින්දරම් සොයිසා** මහතා පත්කර තිබේ. මෙසේ ආරම්භ වූ රබර් ශාකය අද ද මෙම උද්‍යානය තුළ දැකගත හැකි ය. ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වලට හා දකුණු ආසියාතික රටවලට ද මෙසේ රබර් ශාකය හඳුන්වා දී ඇත.

1876 සිට මෙතෙක් සිදුවී ඇති වෙනස්කම් ගැන විමසීමේදී පෙර-මුණගම මහතා රබර් පිළිබඳ වැද-ගත් කරුණු රැසක් ම හෙළි කළේ ය. මෙම කාලය තුළ මෙම උද්‍යා-නයේ විවිධ ශාක වගා කිරීම සඳහා පරීක්ෂණ පවත්වා තිබේ. පසු-කාලයකදී මෙය මහජනයාට විවෘත කිරීමෙන් දැනුම ලබා ගැනීමටත් විවේකය හා විනෝදය සඳහා සුදුසු ස්ථානයක් බවට පත් කරනු ලැබී ය. එහිදී ඒ සඳහා අවශ්‍ය අංග මෙයට එකතු කර ඇත. එනම් අලංකාරය සඳහා ශාක උද්‍යාන අලං-කාර තණ පිට්ටනි වැනි දේ ඉදි කිරීමෙන් මල්වත්තක් බවට පරි-වර්තනය කිරීමෙන් අද දක්වා එය පවත්වා ගෙන යනු ලැබේ.

දැනට මෙම උද්භිද උද්‍යානයේ ඇති එක් එක් කලාපයන් හා එහි වූ සුවිශේෂ ලක්ෂණයන් ගැන අපට විස්තර කියනුයේ **එච්. සිරි-පාල** මහතා ය.

දැනට වසර 15 පමණ සිට මෙම උද්‍යානයේ සුළු සේවකයකු වශයෙන් කටයුතු කරන, ඔහු පැළෑටි එකතු කිරීම වැනි සුවිශේෂ කාර්යයන් හි නිරතවී ඇත. ඔහු මෙම උද්‍යානය තුළ ඇති ශාක පිළිබඳ හසළ දැනුමක් ඇත්තෙකි.

ඔහු මෙම උද්‍යානයේ ඇති කලාප හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳව අපට පහදා දුන්නේ ය.

මෙය දැනට කලාප 6 කට ප්‍රධානව කොටස් කර ඇති අතර එමඟින් අධ්‍යයන කටයුතු පහසු කරන්නක් මෙන් ම උද්‍යානයට අලංකාරයක් ද ගෙන දී ඇත. මෙම කලාපයන් ලෙස,

1. වනෝද්‍යානය
2. තාලවර්ගයේ ශාක එකතුව
3. මල් ගොමුව
4. සිසු උයන
5. මියන වත්ත
6. විනෝද ක්‍රීඩා සඳහා තණ පිට්ටනි

මෙම කලාපයන් ගේ ඇති අලංකාරය හා ඒවායේ සුවිශේෂී ලක්ෂණ දැන ගැනීම සඳහා සිරිපාල සමඟ අප එක් එක් කලාපයන් තුළ කළ ගමනේ දී ඒ ඒ කලාපයට ආවේනික ලක්ෂණ ගැන ඔහුගෙන් විමසීමි.

වනෝද්‍යාන කලාපය තුළ විශාල ශාක බහුලව ඇති අතර ඒ අතරින් විශේෂත්වයක් දරන ශාක වර්ග කිපයක් ද මෙහි ඇත. මේවා අතරට ඒකදේශික ශාක විශේෂයක් වන 'හොර' ශාකය අයත් වෙයි. උද්භිද විද්‍යාත්මකව *Dipterocarpus zylanicus* ලෙස හඳුන්වන මෙය විශාලට වැඩුණු වෘක්ෂයක් වෙයි. මෙය ශ්‍රී ලංකාව තුළදී පමණක් දැකිය හැකි ශාකයකි. තවද වන උද්‍යානය තුළ පිටරටින් ගෙනෙන පලතුරු ශාක ගණනාවක් ඇති, අතර ඒ අතරින් සුවිශේෂී එකක් වන්නේ පලතුරු ශාකයක් වන 'බ්‍රසිල්' වෙයි. මේ ශාකය උද්භිද විද්‍යාත්මකව *Berthe hetia excelas* ලෙස හැඳින්වෙන අතර මෙහි හටගන්නා ඵලය කුටීර 12 කින් යුක්ත ය. ඒවා තුළ බීජ ඇත. එය පලතුරක් ලෙස කෑමට ගනී. ඵල හට ගැනීම මාර්තු - අගෝස්තු කාල වල දී සිදු වේ. තව පලතුරු ශාකයක් වන ඉටිපන්දම් ගස් (Candle tree) මෙය උද්භිද විද්‍යාත්මකව *Parmentiera cerifera* ලෙස හඳුන්වන අතර මෙහි ඵල කහ පැහැයට ඉටිපන්දමක් ආකාරයෙන් දැක ගත හැකි අතර මෙය ඇමරිකාවේ සිට ගෙන එන ලද ශාකයකි.



දෙබිඩ් පොල් ශාකය

තව මෙහි ඇති විශේෂ ශාකයක් වන හුලං ඉද්ද ශාකය ඉතා විශාලව අතු පැතිර ගිය යෝධ වෘක්ෂයක් වන අතර, මෙහි විශේෂත්වය නම් මෙම ශාකයට අකුණු සැර වැදීමේදී කිසිදු හානියක් සිදු නොවීමයි.

මෙම උද්‍යානය තුළ ඉතා අලංකාර ප්‍රදේශයක පිහිටා ඇති මල්ගොමුව තුළ විවිධ වර්ගයට අයත් මල් විශේෂ ඇති අතර මෙහි ප්‍රධානව ඇති මල් වර්ගයක් ලෙස උඩවැඩියා ශාක සැලකිය හැකි ය. උඩවැඩියා අතරින් ලෝකයේ ඇති දිගම මල් පොකුර හටගන්නා උඩවැඩියා ශාකය වන යෝධ උඩවැඩියා (Giant orchid) ශාකය මෙම කලාපයේ පිහිටා ඇත. මෙම ශාකය උද්භිද විද්‍යාත්මකව *Grammaroppyllum speciosum* ලෙස හඳුන්වයි. මෙහි උඩවැඩියා මල් හට ගැනීම සිදුවන්නේ වසර දහයකට වරකි.


එච්. සිරිපාල

තව ද මෙම මල්ගොමුව නරඹන විට අපට දැකගැනීමට ලැබෙන තවත් අපූරු ශාකයක් නම් දෙබිඩ් පොල් ය. මෙය උද්භිද විද්‍යාත්මකව *Lodoicea maladivica* ලෙස හඳුන්වන අතර මෙම ශාකය දැනට ශ්‍රී ලංකාව තුළ බොහෝ විට මෙම උද්‍යානවලට පමණක් සීමා වූ පොල් විශේෂයක් වන අතර මෙහි විශේෂත්වය නම් එක් පොල් ඵලයක් තුළ අභ්‍යන්තර ආවරණ දෙකක් සහිත පොල් ඵලයකි. මීට අමතරව මෙය ඖෂධීය ශාකයක් ලෙස ද භාවිත කෙරේ.


දෙබිඩ් පොල් ඵලය

තව ද මෙම උද්‍යානයට ඉතා අලංකාර දර්ශනයක් ගෙන දෙන මල්වර්ග සහිත ශාක උද්‍යාන මාවත් දිගේ දැකිය හැකි ය. ඒ අතර ප්‍රධානව ඇති ශාකයකි කුකුල් කකුල් නමැති ශාක ය. මෙය විද්‍යාත්මකව *Anberstia nobilis* ලෙස හඳුන්වන අතර මෙහි මල් කුකුල් කකුලටකට සමානවන රතු පැහැයෙන් දිස්වන අතර, මල් ගසේ සිට පහළට එල්ලී පිහිටයි. මෙම ශාක ඔක්තෝබර් - නොවැම්බර් කාලයට මලින් බරවී ඇත.

තවත් මල් වර්ගයක් වන වැනිසියුලා රෝස ශාකය මෙය විද්‍යාත්මකව *Brownea grandiceps* ලෙස හඳුන්වයි. මෙහි රත්පැහැති විශාල මල් හටගන්නා අතර මල් හටගැනීම මාර්තු අගෝස්තු මාස අතර කාල වලදී සිදු වේ. උද්‍යානයේ එක් අන්තයකට ආසන්න ම තාල වර්ගයේ ශාක ගොනුව පිහිටා ඇත. තාල වර්ගයට අයත් ශාක වර්ග 22 ක් පමණ මෙම කලාපයේ ඇත. ඒ අතරින් කටුකිතුල් ශාකය විශේෂයි. මෙය විද්‍යාත්මකව *Oncosperma faseiculata* ලෙස හඳුන්වයි. මෙහි ලංකාවට ම ආවේනික ශාකයක් වන අතර මෙය විශේෂයක් වන්නේ ශාක කඳේ වටයට කටු පිහිටා තිබීම ය.

තවත් අලංකාර ශාක විශේෂයකි 'සීලිං වැක්ස්'. මෙය විද්‍යාත්මකව *Crytostachysremda* ලෙස හඳුන්වයි. මේ උද්‍යාන අලංකාරය

සඳහා භාවිත කරන ශාකයක් වන අතර රත් පැහැයෙන් යුක්ත යි.

තාලවර්ගයේ ශාක ගොනුවට පිටුපසින් පිහිටා ඇත්තේ උද්‍යානයේ අධ්‍යාපනික කොටසක් ලෙස සලකන සිසු උයන යි. මෙහි ප්‍රධාන ලෙස ඇත්තේ ඖෂධීය ශාක යි. ඉතා දුර්ලභ ගණයේ ඖෂධීය ශාකවල සිට සුලභ ඖෂධ වර්ග දක්වා පැළ මෙහි අන්තර්ගත වන අතර මේවා නිතරම අධ්‍යයනයට භාජනය කරනු ලබන්නේ පාසල් සිසුන් විසිනි. මෙම කලාපයේ දුර්ලභ ඖෂධ ලෙස 'අක්මැල්ල' මෙය විද්‍යාත්මකව *Spilanthus paniculata* ලෙස හඳුන්වන අතර මෙය දත් කැක්කුම සඳහා වූ ඖෂධ සෑදීමට භාවිත කෙරේ.

'කළුවෙල්ලත්ගිරිය" ද පඳුරු ශාක විශේෂයක් වන අතර කැඩුම් බිඳුම් සඳහා භාවිත කෙරෙන ඖෂධීය ශාකයකි. මෙය විද්‍යාත්මකව *Paramignya monophylla* ලෙස හැඳින් වේ. මීට අමතරව "මලිත", "යකමතස්ස" ආදී ඖෂධ ශාක මෙහි අන්තර්ගත ය. සුලභ ඖෂධ ලෙස 'අරළු', 'බුලු', 'හුලං' හික් ආදී ශාක ද මෙහි දැකිය හැකි ය.




හුලං ඉද්ද ශාඛය

තැනින් තැන පිහිටා ඇති තණ පිට්ටනි නඩත්තුව සඳහා විශාල පරිශ්‍රමයක් දරන බව එහි යන කෙනෙකුට දැකගත හැකි ය. ඒවා පවත්වාගෙන යැමේ අරමුණ හා වර්තමානයේ මෙම උද්‍යානයේ භාවිතය පිළිබඳ අප කළ විමසුමකට පෙරමුණගම මහතා ගේ පිළිතුර වූයේ මෙයයි.

"මේ තැනින් තැන තිබෙන තණ පිට්ටනි අප පවත්වාගෙන යන්නේ අවිවේකී නාගරික ජීවිත ගත කරන, විවේකය හා විනෝදය ලබා ගැනීමට පැමිණෙන ජනතාව හා කුඩා දරුවන් සඳහා විනෝදවීමට අවශ්‍ය ඉඩකඩ ලබාදීමට හා කුඩා දරුවන්ට දුව පැන ඇවිද විනෝදවීම සඳහා යි."

"දැනට මෙම උද්භිද උද්‍යානය භාවිත කරන්නන් අතර බහුලව ඇත්තේ පෙම්වතුන්. නමුත් ඔවුන් මෙය උද්භිද උද්‍යානයක් බව නොදැන ගැනීම අවාසනාවක්. ඔවුන් ගේ හැසිරීම් රටා නිසා වර්තමානයේ දී මෙම උද්‍යානය භාවිතය මහජනතාවගෙන් ඈත් වෙමින් තියෙනවා. කුඩා දරුවන් සමඟ පැමිණෙන දෙමාපියන් එක් වතාවක් පැමිණිය හොත් නැවත



සිසු උයන

පැමිණීම ඔවුන් විසින් අතහැර දමනු ලබනවා. එයට මෙම පෙම්වතුන් ගේ හැසිරීම් රටා බලපානවා. තව ද මෙම පෙම්වතුන්ගෙන් ප්‍රයෝජනය ගන්නා ව්‍යාජ පත්‍රිකා විකිණීම වැනිද සිදුවන අතර එම ක්‍රියාවන් වැළැක්වීම සඳහා උද්‍යාන පරිපාලනයට විශාල පරිශ්‍රමයක් දරන්නට සිදුවී තියෙනවා.

පෙරමුණගම මහතා විසින් පෙන්වා දුන් ගැටළුව එදින උද්‍යානය නැරඹීමට පැමිණ සිටි ගුරු උපදේශක කණ්ඩායමකින් කළ විමසීමක දී අපට දැනගන්නට ලැබුණ. මෙම පෙම්වතුන් නිසා ඔවුන්ට නිසියාකාරව ගහක් කොළක් නැරඹීමටවත් නොහැකි බව ය. මක්නිසාද සෑම ගසක් අසල ම මේ පෙම්වතුන් සිටින නිසා ය. තව ද පාසල් සිසුන් පිරිසක් ද ඔවුන් ගේ අධ්‍යාපනික කටයුත්තක් 'සඳහා උද්‍යානය ගැන දැනගැනීමට පැමිණි නමුත් ඔවුනට අවශ්‍ය තැන්වලට යාමට සහ අවශ්‍ය දේ දැනගැනීමට නොහැකි තත්ත්වයක් එම පෙම්වතුන් ගේ ක්‍රියා කලාපය නිසා උද්ගත වූ බව කියා සිටියහ.

මෙම ප්‍රශ්නය පෙම්වතුන් කිප දෙනෙකුට යොමු කළ විට ඔවුන් පවසා සිටියේ ඔවුන්ට විවේකය ගත කිරීම සඳහා ඇති ආරක්ෂිත ස්ථානයක් ලෙස මෙය භාවිත කරන බවත් ඔවුනුත් අන් අය මෙන් ම මුදල් ගෙවා ඇතුල් වී ඇති බවත් ය.

එහෙත් ඉතා සුළු පිරිසක ගේ අනියම් හැසිරීම් නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවී ඇති බවත් එය ඔවුන්ට ද ප්‍රශ්නයක් වී ඇති බවත් ඔවුන් ගේ අදහස විය.

තවද අධික වැසි සහිත දිනවලදී මෙම උද්‍යානයේ ඇති මාවත් ඉත් එහා ඇති ගම්මුන් විසින් භාවිත කිරීම නිසා උද්‍යාන කටයුතුවලට යම් යම් බාධාවන් ඇතිවන බව එහි සිටි සුළු සේවක **එම්. ඒ. එල්. වික්‍රමසිංහ** මහතා කීවේ ය.

ඉහත ගැටළු තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා පෙරමුණගම මහතා කියා සිටියේ මෙම උද්‍යානය මහජනයා විසින් වැඩිපුර භාවිතයට ගැනීමෙන් හා ආයතනික වශයෙන් මෙම උද්‍යානය විද්‍යාත්මක දැනුම ලබාගැනීම සඳහා භාවිත කිරීමෙනුත් මේ තත්ත්වය මගහරවා ගත හැකි බව යි. ගැටළුවක් ඇති වුවහොත් ඒ සඳහා පිළියම් යෙදිය හැකි බවත් ඒ මහතා වැඩිදුරටත් කීවේ ය.

මෙම උද්‍යානයේ පොදු අරමුණු වන ජනතාවට විවේකය, විද්‍යාත්මක දැනුම ලබාදීම යන දේවලින් ඔබ්බට විහිදී ඇති බව සඳහන් කරන පෙරමුණ මහතා ඔවුන් ගේ අනෙකුත් කාර්යයන් ලෙස දැනට කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ කෘෂි වැඩසටහන් යටතේ විසිතුරු මල් වගා කරුවන් සඳහා අවශ්‍ය විසිතුරු මල් පැළැටි ලබා දීම ඒ සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම ලබාදීම මෙන් ම එම විසිතුරු මල් වගාකරුවන් සඳහා අවශ්‍ය වෙළෙඳ පොළ සොයාගැනීම සඳහා ද උපකාරයන් මෙම උද්භිද උද්‍යානයේ දැනට සිදුකරන බවත් පැවසී ය. ❑

සටහන -
**ලසන්ත දිසානායක**

ඡායාරූප -
**ලක්ෂ්මන් විමලරත්න**